## අරාබි ගිය දියණිය

ප්‍රේමවංස දසනායක
ඇල්ටෝනා, වික්ටෝරියා

හිරු දහසක් නෙත දිලිසුනි
ගිඩි ගිඩි ගා හද වෙව්ලූනි
ළපටි ගෙලට රැහැණ වැටුනි
අවිහිංසක ගත හැකිලූනි

උපතින් පෙළපත නොලදිමි
වත් පොහොසත් කම් නුදුටිමි
එනමුදු ලක් මෑණියනේ
මම දු ඔබගෙ දියණියක් මි

මා මව් පිය අත සරු නැත
බැල මෙහෙ කර කුස පුරවත
මගේ බාල සොයුරු කැලට
මා මිස අන් සරණක් නැත

මගෙ වයසේ තව දැරියෝ
නුදුරු නිවෙස් වල සිටියෝ
හෙට දින ගැන දුකක් නොවී
නිතොර දෙවේ කල් ඇරියෝ

උදෑසණින් අවදි වෙලා
නිල ඇඳුමින් සැරසීලා
පාසල් යනු දුටිමි ඔවුන්
පාර දිගට පෙළ සැදිලා

මට නොලැබුණ ඒ දිවිපෙත
ගැන අහිතක් නැත මා සිත
හැකිවෙද එය ලබා දෙන්න
මගේ බාල සොයුරන් වෙත

ඈත එපිට සයුරින් වට
වැලි කතරින් බිහිවුන රට
අත ගෑවෙන ඉසුරු පොදක්
පිහිට වේවි දිළිඳු අපට

ළමාවියට සමු දෙනවා
පවුල් බරට කර දෙනවා
හිත ගත දහිරිය අරගන
මං එහි පිට මං වෙනවා

ඒ රට සුවිසල් මැදුරේ
බැල මෙහෙ කරනා වාරේ
මගෙ සොයුරන් දෙමාපියන්
සිහි කරනෙමි නිරන්තරේ

සැඩ හිරු රැස් මැඩ ගන්නෙමි
දුක් හිරිහැර දරාගනිමි
ගත දහදිය මුගුරු හලා
හාම්පුතුන් සිත සතපමි

නුහුරු ගමන මග වරදි ද
තනි නොතනිය හද වෑවෙද
නන් නාඳුනනා දේසේ
මා සිර වී මිය ඇදේ ද

දියණියනි ළඳ බොළඳ
සමු ගැනුන මරු වැලඳ
කුරිරු ලොව නැත නිබඳ



## හරස් වීදියේ සිට

අනූපමා ගනේගොඩ

පැල්ලම් වැටී ඉරි තැලී කහ ගැහුණු යමකින්
සොයගත හැකිවෙද කිසිවක් පුරුදු විලසින්
ගිම්හානයේ දිගු පියවර තබා යන ගමනින්
වීසි කළ කවියක් ඇහින්දෙමි වීදි කොනකින්

එබී කවියට දෙගිඩියාවෙන් ගැහෙන හදකින්
අමතකව ගිය හුරු පුරුදු ඇද අකුරු අතරින්
තිගැස්සී වෙව්ලා යළිත් අත හැරුණොත්
හැඳින ගත්තෙමි මගේ හිත අසුරු සැණෙකින්

ඒ නුවර බොහෝ කලකට පෙර තිබූ මල් උයන්
මිදි වතු ද දිව රසය රැගෙන ආ රතු වයින්
කලූ කබා කොලරයෙන් ඇද හාදු දුන් ලියන්
හීනයක් මැයි දැන් මතකයෙත් නැති තරම්

ඉරුණු අවුරුදු ගෙවී අතහැරුණ හැමදේක
දුක් සුසුම් හා කඳුළ මුහුව ගිය මද සුළඟ
මහ මගට කට ඇරුණ වීදියේ කෙළවරක
ඇවිද යන මහලූ මගියන් සිඹියි මතුදාක



boondi.lk

## විියපත් වීම

| | | |
|---|---|---|
| 01. | "නාකියි" යන්න පදයක් වේ | විසේසන |
| | "නොහැකිය" කියන අරුතකි එය | ලබාදෙන |
| | විස්තර කරන විට වියපත් කෙනා | ගැන |
| | මෙපදය යෙදේ-කරුණකි ඉන් | පෙනීයන |
| 02. | අත් පා මෙහෙයවා නිසි අයුරු සිදු | කළ |
| | කටයුතු කරන්නට නැත ඔහුට සවි | බල |
| | මනසින් කළ දේද තරුණෙකුව සිටි | කල |
| | නොහැකිය - කෙමෙන් වී ඇත සිහිය | දුරුවල |
| 03. | පවතින දුබලතාවෙකි පෙනුමෙහි | දෑසේ |
| | රැඳවා ගත් උපැස් යුවලකි මත | නාසේ |
| | පැහැදිලි ලෙසට කිසිවක් සවනට | නෑසේ |
| | සිරුරෙන් පැන ගොසිනි හැකියාවන් | රාසේ |
| 04. | සෙලවේ තිබෙන දත් - තුබු දත් හැලී | ඇත |
| | කළු කෙස් ටිකක් පැසිලා සුදු | වෙලා ඇත |
| | සුමටව තිබුනු හම දැන් රැළි | වැටී ඇත |
| | මියැදෙන්නටත් පෙර මේවා | දිරා ඇත |
| 05. | පියවර තබනු නොහැකිය නොසැලෙන | ලෙසට |
| | සිදුවෙයි සොයන්නට සැරයටියක | පිහිට |
| | වා-පිත්-සෙම් රෝග ගත සහ සිත | දෙකට |
| | වදදෙයි ඉගි කරයි මරණය ලඟ | බවට |
| 06. | තම දරුවනගෙ සැම බර හැකි කල | ඉසිලූ |
| | සමහර දෙනා බැරි කල ඔවුනට | වහ-ලූ |
| | එම විට පැතුම් සුන්වී යාමෙන් | සියලූ |
| | නිම වෙයි ඔවුනගේ දිවි මඩමක | මහලූ |
| 07. | දිවියේ නොතිර බව නිති සිහියට | නඟන |
| | පව්කම් වලින් වැලකී කුසලෙහි | යෙදෙන |
| | වියපත් කෙනෙක් වේනම් මෙත් සිත | වඩන |
| | නොසැලී ඔහුට දිය හැක මරණෙට | මුහුණ |
| 08. | **නංවාලීම සඳහා රට - දැය -** | **සමය** |
| | **කැපකොට තම දනය කාලය සහ** | **ශ්‍රමය** |
| | **දුබලව සිටින ගෙවමින් අවසන** | **සමය** |
| | **වියපත් පිරිස සුරැකුම අප** | **යුතුකමය** |

හෑගොඩ විජයපාල ඩබ්. ගුණරත්න

## ගාලු කොටුපවුර සහ සුනාමිය

ජනිත ප්‍රේමරත්න

තරහ ගිය මහ මුහුද
රැල්ල උස්සන් කරට
මරාගන්නට ආව දවසේ
ගස්වලත් පස්ස බිම ඇනුණෝ

සිවු සියවසක් මහලූ
ලන්දේසියෙක් වෙලත්
එදා ඒ කලබලය අස්සේ
නුඹයි ඉස්සරහින්ම හිටියේ

ඇඟට පැනලා මුහුද
රැල්ල උස්සා ගැසුව
දරුණු දිය පහර එක එල්ලේ
ගල්ගැසුණු පපුවෙමයි වැදුනේ

තුරුළු කරගෙන සෙනඟ
නතර කෙරුවත් මුහුද
එදා ඉරිතැලූණු නුඹෙ පපුවේ

## කැන්ගරු දේශයේ වෙසෙන අපේ ශ්‍රී ලාංකික සහෘදයන්ට ....

| | |
|---|---|
| නව හිරු කිරණ ලැබ පිබිදෙයි මුළු | ලොව ම |
| 2014 නව වසරට පිය නගයි | සැම |
| සාමය, සතුට ලැබගෙන දැක | ලෝදහම |
| සුබ පතනෙමු ඔබට සිහිකර | අපේකම |
| දෙදහස් දහහතර සුබ නව වසරකි | සැමට |
| වෙන් වී සිටිය මුත් රැඳෙනෙමු ඔබ තනි | නොකොට |
| ලක්වැසි සැමගෙ සුබ පැතුමන් ගෙන | එකට |
| පතනෙමු ඔබට දළඳ සමිඳුගෙ | පිහිට |

රනීශා කරුණාරත්න,
මහනුවර, අස්ගිරිය ශ්‍රී සුමනතිස්ස දහම් පාසල

## " සිම්ෆනි"

මෙල්බන් නුවරින් බිහිවුණ නවතම සංගීත කණ්ඩායම "සිම්ෆනි" "Symphony" සිය කළ එළි බැසීම දෙසැම්බර් 24 වන දින පවත්වන ලද්දේ හිතවතුන් රැසකගේ ආශිර්වාදය මධ්‍යයේය. මේ එම අවස්ථාව සන්නස කැමරාවේ සටහන් වූ ආකාරයයි.









Band Members

- Asanka Gangahagedara – Keyboard & the leader (Professional Qualified Keyboardist/ Keyboard instructor)
- Nilini Bamunuarachchi – Female Vocalist (Professional vocalist with music qualification)
- Rukshan Tharanga – Vocalist (Sound knowledge of vocal)
- Praveen De Mel – Rhythm Guitar & Vocal (Rhythm guitarist & English Vocals)